# පිළිසඳර
# PILISANDARA

**2018**
**ජූලි/ඔක්.**
npassrilanka@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of the National Photographic Art Society of Sri Lanka











## "ආලෝකය" රැගෙන රයිගම් පුරවරයට ගිය ගමන....









ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය වාර්ෂිකව පවත්වනු ලබන ආලෝකකරණ වැඩමුළුව මේ වසරේදීත්, සැප්තැම්බර් මස 15, 16 දෙදින බණ්ඩාරගම සර්වෝදය පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

අධ්‍යාපන අධ්‍යක්ෂ රාහුල පෙරේරා මහතාගේ මග පෙන්වීම යටතේ දෙවැනි වසරේ ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ සංවිධායකත්වයෙන් ඇරැඹුණු මෙවර 'ආලෝකකරණ වැඩමුළුව' සඳහා පළමු වසර, දෙවැනි වසර, තෙවැනි වසර ශිෂ්‍ය - ශිෂ්‍යාවෝ රැසක් සහභාගි වූහ. කණ්ඩායම් කිහිපයක් යටතට බෙදා ඇරැඹුණු, මේ වැඩමුළුවේදී දේශන සඳහා සහභාගි වූයේ සරත් පෙරේරා, ශාන්ත ගුණරත්න, හර්ෂ මධුරංග, අතුල රණරාජ, රසාංග දිසානායක, යන ක්ෂේත්‍රයේ ප්‍රවීණ ගුරු භවතුන් ය. ඊට අමතරව ප්‍රවීණ ඡායාරූප ශිල්පී හෙන්රි රාජකාරුණා මහතාගේ විශේෂ දේශනයක් පළමු දින (15 වැනිදා) රාත්‍රියේදී පැවැත්වීම ද විශේෂත්වයකි.

මේ වැඩමුළුව සඳහා ශෂී නිර්මාණි, ඉන්ද්‍රචාපා දිසානායක, යොහාන් කවිෂ්ක, හංසි හෙට්ටිආරච්චි, කෝසලා මැද්දෙගොඩ, මාවන් කාවිංග යන නිරූපණ - නිරූපිකාවන් තම සහයෝගය ලබාදුන් අතර ඔවුන්ව හැඩ ගන්වන ලද්දේ පළමු වසරේ පවිත්‍රා උදේශිනී ආනන්ද ශිෂ්‍යාව විසිනි.

සාර්ථකව පැවැත්වුණු වැඩමුළුව අවසානයේ සියලු ම ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට හට සහතිකපත් පිරිනැමුණු අතර දේශන පැවැත් වූ ගුරුභවතුන්ට ද විශේෂ තිළිණ පිළිගැන්වීම සිදුවිය. ගතවුණු දෙදිනක කාලයේ ගත් ඡායාරූප ඇසුරින් පවත්වන ලද ඡායාරූප තරගයේදී පළමු ස්ථානය සරත් පතිරණ, දෙවැනි ස්ථානය රාජිත මධුශංක, තෙවැනි ස්ථානය ඉසුරු මදුමාල් යන ශිෂ්‍ය - ශිෂ්‍යාවන් හිමිකර ගත් අතර චමිත් බාලසිංහ, ඉෂාන් මනෝජ්, පවිත්‍රා උදේශිනී, යුෂාන්ත කුමාර යන ශිෂ්‍ය ශිෂ්‍යාවෝ කුසලතා සහතිකපත් දිනා ගත්හ.

මේ කටයුත්තේදී ප්‍රධාන මූල්‍යමය අනුග්‍රාහකත්වය Camera lk දක්වන ලද අතර නින්ජා ඇතුළු අනුග්‍රාහකයෝ රැසක් ද මූල්‍යමය දායකත්වය දැක්වූහ.

වැඩමුළුවේ සංවිධායකත්ව මෙහෙවර ඉටුකරනු ලැබුවේ චාමර සංජීව, තුෂාර කළුනායක, සමීර කොතලාවල, හර්ෂනී ශානිකා සහ තිලානි ශානිකා යන සාමාජික සාමාජිකාවන්ගෙන් සැදුම් ලත් කමිටුව විසිනි.

# ප්‍රමුඛ පුවත්

## නව පිවිසුමකට පෙළගැස්මක්....

### 65 වන මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 65 වන මහා සභා රැස්වීම 2018 ජූලි මස 15 වන දින රාජගිරිය සිංහ සමාජ ශාලාවේ දී පැවැත්වුනු අතර, එහිදී සංගමයේ උන්නතිය උදෙසා ඉදිරියේ දී ගත යුතු ක්‍රියා මාර්ග රැසක් සාකච්ඡාවට බඳුන් වූ අතර, එළැඹෙන 2018/2019 වසර සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ගැනීම ද මෙහිදී සිදුවිය.

### 2018/2019 වසර සඳහා තේරීපත් වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| **සභාපති** | - කංචන මාරසිංහ<br>**0777 30 36 25** |
| **විධායක අධ්‍යක්ෂ** | - සමන් කුලසූරිය<br>**0714 81 18 59** |
| **අධ්‍යක්ෂ - මුදල්** | - කීර්ති නිශ්ශංක<br>**0777 79 66 17** |
| **අධ්‍යක්ෂක - අධ්‍යාපන** | - රාහුල පෙරේරා<br>**0777 30 94 32** |
| **අධ්‍යක්ෂ - ලේඛකාධිකාරි** | - සාලිය ලියනගේ<br>**0713 96 30 30** |
| **අධ්‍යක්ෂ - ප්‍රකාශන** | - ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ<br>**0723230329** |
| **අධ්‍යක්ෂ - සංවර්ධන හා ප්‍රවර්ධන** | - තුෂාර ධම්මික සමරකෝන්<br>**0714 89 48 48** |
| **අධ්‍යක්ෂ - ප්‍රදර්ශන** | - සංඛ සම්මාන පෙරේරා<br>**0777 76 80 15** |
| **අධ්‍යක්ෂ - සමාජ සේවා හා සුබ සාධන** | - ඒ.එම්. ජයතිලක<br>**0777 30 58 36** |

## උකහා ගත් දැනුම විදහා දැක්වීම......

### 55 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය – 2017

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය විසින් මෙහෙයවනු ලබන ඡායාරූප ශිල්පය සඳහා වූ තුන් අවුරුදු ඩිප්ලෝමා පරීක්ෂණයට අදාල ප්‍රතිඵල පහත සඳහන් වේ.

පළමු වසර සඳහා සිසුන් 118 ක් සහභාගි වු අතර, විශිෂ්ට සාමාර්ථයක්, සම්මාන සාමාර්ථ 09 ක් හා සාමාන්‍ය සාමාර්ථ 42 ක් ද,

දෙවන වසර සඳහා සිසුන් 53 දෙනෙකුගෙන් සම්මාන සාමාර්ථ 3 ක් හා සාමාන්‍ය සාමාර්ථ 26 ක් ද,

ඩිප්ලෝමා වසර වෙනුවෙන් සම්මාන 01 ක් සහ සාමාන්‍ය සාමාර්ථ 10 ක් ලෙසිනි.

### පාසැල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය - 2018

ශ්‍රී ලංකා ජාතික ඡයාරූප කලා සංගමය මගින් පාසැල් දරුවන් සඳහා වාර්ෂිකව පවත්වන ඡායාරූප ශිල්ප පරීක්ෂණය දෙසැම්බර් මස 01 වැනි සෙනසුරාදා කොළඹ 10 මහ බෝධි විදුහලේදී පැවැත්වීමට නියමිතව ඇත.

පාසැල් ඡායාරූප සංගම්වල විෂය හදාරන දරුවන් මෙන්ම ඡායාරූප ශිල්පය ගැන උනන්දු වන ඕනෑම ශිෂ්‍යයෙකුට මේ සඳහා ඉදිරිපත් වීමට අවකාශ ඇත. ඔබ සම්බන්ධ පාසැල් ඡායාරූප සංගමයකට, මාධ්‍ය සමාජයකට හෝ ඡායාරූප ශිල්ප විෂය හදාරන දරුවන් සිටී නම් මේ පිළිබඳව දැනුවත් කරන්න.



මෙම ලිඛිත පරීක්ෂණයේ සාමාර්ථය ලබා ප්‍රායෝගික පරීක්ෂණයට ද ඉදිරිපත් වන දරුවන්ට සංගමය විසින් මෙහෙය වන ඡායාරූප ශිල්ප ඩිප්ලෝමාවේ දෙවන වසර සඳහා ඇතුළත් වීමට ද අවකාශ හිමිවනු ඇත.

**විමසීම් : ගරු ලේඛකාධිකාරී සාලිය ලියනගේ (071 3963030) මහතා**

ප්‍රමුඛ පුවත් සඳහා තවදුරටත් 7 පිටුව බලන්න

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය

### ඡායාරූප ශිල්පය පිළිබඳව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මඟින් නොමිලේ පවත්වනු ලබන ඡායාරූප ශිල්පය පිළිබඳව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා මේ දිනවල අයදුම්පත් බාරගනු ලැබේ



අයදුම්පත් බාර ගන්නා අවසාන දිනය 2018.12.15

අයදුම්පත් සඳහා පිවිසෙන්න
http://www.npasslanka.org/Membership.html

තැ.පෙ. 452, කොළඹ
www.npasslanka.org

විමසීම් - සාලිය ලියනගේ 0713 96 30 30

## The National Photographic Art Society of Sri Lanka

### නව සාමාජිකයන් බඳවා ගැනීම

2019 වසර සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීම සඳහා දැන් අයදුම්පත් නිකුත් කර තිබේ.
සංගමයේ ලබාදෙන මුද්‍රිත අයදුම්පත හෝ අන්තර්ජාල වෙබ් අඩවිය වෙතින් බාගත කරගන්නා අයදුම්පත්‍රය නිසි පරිදි පුරවා 35mm x 45mm ප්‍රමාණයේ ඡායාරූප දෙකක් සහ ඇතුළත්වීමේ ගාස්තුව සහ වසරක සාමාජික මුදල ද සමඟ භාර දීමෙන් සාමාජිකත්වය ලබාගත හැකි වනු ඇත.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2018 දෙසැම්බර් 15 වේ.

පසුගිය වසරේ මෙන්ම මේ වසරේ ද විශේෂ සාමාජික ප්‍රවර්ධන කට්ටලයක් පිරිනැමීමට සංවිධාන යොදා ඇත.




---

තැ.පෙ. 452, කොළඹ
www.npasslanka.org

අයදුම්පත් සඳහා පිවිසෙන්න
http://www.npasslanka.org/Membership.html

සියලු විමසීම්
සාලිය ලියනගේ මහතා : 0713 96 30 30

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය









## සොබාදහම කැමරා ඇසට

ජෛව විවිධත්වයෙන් පරිපූර්ණ අසිරිමත් සොබාදහම් නිමැවුමක් වූ මුතුරාජවෙල පරිසර පද්ධතියේ අසිරිය කැමරා කාචයට හසුකර ගැනීම සඳහා වූ ''මුතුරාජවෙල සොබා දහම් වැඩ මුළුව'' මෙවර 2018 ඔක්තෝම්බර් මස 28 දිනය පුරාවට එම පරිසරය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වුනු අතර, ඊට සම්පත් දායකත්වය ප්‍රවීණ වනජීවී ඡායාරූප ශිල්පීන් වන වෛද්‍ය ලලිත් ඒකනායක සහ ප්‍රසාද් හපුආරච්චි යන මහත්වරුන් විසින් ලබාදෙන ලදී. වැඩසටහනේ සංවිධායකත්වය අධ්‍යක්ෂ - සංවර්ධන සහ ප්‍රවර්ධන තුෂාර ධම්මික සමරකෝන්, අධ්‍යක්ෂ ලේඛකාධිකාරි සාලිය ලියනගේ සහ හිටපු අධ්‍යක්ෂ - ප්‍රකාශන මනුජිත් කටුගම්පොල යන මහත්වරුන් විසින් සිදුකරන ලදී.

## දෙවන වසරට වර්ණ කළමණාකරනය මෙවරත්.....



දෙවන වසර විද්‍යාර්ථීන්ගේ දැනුම වර්ධනය උදෙසා වාර්ෂිකව සංවිධානය කරනු ලබන “ වර්ණ කළමණාකරනය පිළිබඳ දේශණය” මෙවරත් වැල්ලවත්ත Debug Epson ආයතන පරිශ්‍රයේදී 2018 සැප්තැම්බර් මස 30 වන දින පැවැත්වුණු අතර, වැඩ මුළුව සඳහා සම්පත් දායකත්වය නීල් කුරේ මහතා විසින් ලබාදෙන ලදි, මෙම වැඩමුළුව සඳහා නීල් කුරේ මහතා මේ වන විට අඛණ්ඩව අවස්ථා හතරකදී තම දායකත්වය ලබාදී ඇත.

අනුග්‍රාහක දායකත්වය Debug Epson ආයතන විසින් දරනු ලැබූ අතර වැඩ මුළුවේ සංවිධාන මෙහෙවර දෙවන වසර අධ්‍යාපන සමායෝජක ප්‍රේමසිරි හිදැල්ල ආරච්චි මහතා විසින් සිදුකරනු ලැබීය.

# සේයාරූ ඇදුරු අනුස්මරණ දෙසුම....








සිංගමයේ නිර්මාතෘ දිවංගත විල්සන් හෑගොඩ මහතාගේ 34 වන ගුණානුස්මරණය වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ අනුස්මරණ දෙසුම මෙවර, දෙවන වසර විද්‍යාර්ථීන් සංවිධානය කරනු ලැබූ ආලෝකකරණ වැඩ මුළුවට සමාන්තරව බණ්ඩාරගම සර්වෝදය පුහුණු ආයතනයේ දී 2018 සැප්තැම්බර් මස 16 වන දින පැවැත්වුනු අතර, එම දේශනය අප සංගමයේ හිටපු සභාපතිවරයා වූ ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා විසින් පවත්වන ලදී.



මෙහිදී ආචාර්ය ගුණසේකරයන් ''කැමරා ලේඛනයෙන් හෙළිවන හෑගොඩ චින්තනය'' මැයෙන් පැවැත්වූ එම දේශනය හෑගොඩ වියතාණන් පිළිබඳව කෙරෙන හැදෑරීම් සඳහා නව මානයක් විවර කළ අතර, හෑගොඩයන්ගේ ඇසුර නොලද නව්‍ය සාමාජිකත්වයට එතුමා පිළිබඳව හා එතුමා ඉටුකල කාර්යභාරය පිළිබඳව පුළුල් වැටහීමක් ලබාගැනීමට ද දායක වූ මැනවින් පෙළගස්වන ලද හරවත් දෙසුමක් ලෙස සහභාගීවූවන්ගේ පැසසුමට ලක්විය.



එසේම එම දෙසුමට ප්‍රථම හෑගොඩ මහතාගේ කනිටු පුත් අනුර හෑගොඩ මහතා විසින් ''අපේ තාත්තා'' මැයෙන් හෑගොඩ මහතා පිළිබඳව කෙරුණු කෙටි දෙසුම ද මෙම කර්තව්‍ය තවදුරටත් අර්ථ පූර්ණ කිරීමට බෙහෙවින් දායක විය.

මෙම දේශනය සඳහා හෑගොඩ පවුලේ සාමාජිකයින් මෙන්ම සංගමයේ බොහෝ ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවන් ද, සභාපති කංචන මාරසිංහ මහතා ප්‍රමුඛව අධ්‍යක්ෂක මණ්ඩලය නියෝජනය කරමින් එහි සාමාජිකයින් ද සහභාගිවී සිටිනු දක්නට ලැබුණි.

## සමාජ සේවා පුවත්

### සමාජ ප්‍රගමනයට ඡායාරූප ශිල්පය



මත් ද්‍රව්‍ය, පරිසරය හා කුසගින්න තේමාව කර ගනිමින් නිදහස උදෙසා ජනතා ව්‍යාපාරය විසින් සංවිධානය කරන ලද **"පානදුරේ මහා සාහිත්‍ය උළෙල - 2018"** ඔක්තෝම්බර් මස 3, 4 හා 5 යන තෙදින පානදුර නගර ශාලා හා පුස්තකාල පරිශ්‍රයේදී පැවැත්වුනු අතර, එහි සාර්ථකත්වයට ශ්‍රී ලංකා ඡායාරූප කලා සංගමයේ සක්‍රීය දායකත්වය ලබාදීම සිදු කෙරුණි.



ඒ අනුව මෙහි එක් අංශයක් වූ ඡායාරූප හා චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සහභාගි වූ සිසු දරුවන් වෙනුවෙන් ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම හා ඉදිරිපත් වූ කෘතීන් විනිශ්චය කිරීම සඳහා සංගමයේ හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකු වූ ප්‍රියන්ත අබේසුන්දර මහතාගේ පරිපූර්ණ දායකත්වය ලබාදුන් අතර, ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රේමසිරි හිදැල්ලආරච්චි මහතා හා ක්‍රියාකාරී සාමාජික උවිදු ලොකු ලියන මහතාගේ සහභාගිත්වය ද මීට හිමිවිය.

මෙම කර්තව්‍යයන් සඳහා සම්බන්ධීකරනය සංගමයේ ප්‍රකාශන අංශය විසින් සිදු කරන ලදී.







# අපේ විත්ති

## රාජ්‍ය ඡායාරූප උළෙල - 2018



හෙන්රි රාජකරුණා මහතා වෙත හරසර

ජාත්‍යන්තර ඡායාරූප දිනයට සමගාමීව උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමඟ එක්ව සංවිධානය කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය ඡායාරූප උළෙල හා ත්‍යාග ප්‍රදානෝත්සවය 2018 අගෝස්තු 19 වනදා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් ගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අන්දමින් නෙළුම් පොකුණ රඟහලේ දී පවත්වනු ලැබීය.

මෙම උළෙලේදී අපගේ ජ්‍යෙෂ්ඨ සාමාජික ප්‍රවීණ ඡායාරූප ශිල්පී හෙන්රි රාජකරුණා මහතා වෙත, එතුමන් විසින් ඡායාරූපකරණය උදෙසා ඉටුකළ මෙහෙය අගයනු වස් කෙනෙකුගේ ජීවිතයේ එක්වරක් පමණක් පිදුම් ලබන **ඡායාරූප අභිමානී** සම්මානයෙන් පිදුම් ලැබීය.

### ගගන්ට සහ නවීන්ට ද ජයග්‍රහණ.....






තවද මෙම උළෙලේදී අප සංගමයේ තෙවන වසර විද්‍යාර්ථයෙකු, වන ගගන් කරුණාචන්ද්‍ර මහතා ''ජීවන රටා හා සංස්කෘතිකාංග තරග අංශය වෙනුවෙන් ඉදිරිපත් කළ නිර්මාණයට ප්‍රථම ස්ථානය හිමි වූ අතර දෙවන වසර විද්‍යාර්ථයෙකු වන නවීන් දම්සර මහතා විවෘත අංශය වෙනුවෙන් ඉදිරිපත් කළ නිර්මාණයට ප්‍රථම ස්ථානයද හිමි කර ගන්නා ලදී.

මෙම ජයග්‍රහණ හිමිකරගත් ඡායාරූප ද්විත්වයම සංගමයේ විද්‍යාර්ථයින් වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කෙරෙන වැඩමුළු වල දී ලබාගත් ඡායාරූප වීම ද විශේෂත්වයකි.

## සුවඳ පද්ම සම්මාන උළෙල - 2018





### චන්ද්‍රසේන පෙරේරා මහතා වෙත
### සුවඳ පද්ම රජත සම්මානය





අප සංගමයේ ගෞරව සාමාජිකයෙකු මෙන්ම ප්‍රවීන රංගධරයෙකු, අධ්‍යක්ෂවරයෙකු, දේශකයෙකු හා ලේඛකයෙකු වන කලාශූරි සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතාගේ සභාපතිත්වයෙන් යුත් කැළණිය මිහිදු සංස්කෘතික පදනම විසින් හත්වන (07) වන වරටත් සංවිධානය කරන ලද ''සුවඳ පද්ම'' උපහාර සම්මාන උළෙල මෙවරත් කොළඹ බිෂොප් විද්‍යාලයීය ශ්‍රවනාගාරයේ දී 2018 ඔක්තෝම්බර් 18 වැනි දින අති උත්කර්ෂවත්ව පැවැත්වූ අතර, එහිදී අප සංගමයේ **ජ්‍යෙෂ්ඨ සාමාජික, ප්‍රවීන ඡායාරූප ශිල්පි චන්ද්‍රසේන පෙරේරා මහතා සුවඳ පද්ම රජත සම්මානයෙන් පිදුම් ලැබිය.**


### අපේ මහගෙදර අපිම තනමු

*මේ පිළිබඳව ඔබ දන්නා තොරතුරු එලෙසමයි. තවදුරටත් අවැසි ඔබගේ පරිත්‍යාගශීලීත්වයේ දෑත දිගු කිරීම පමණි. ඔව්, ඔබ එය ඉටකරනු ස්ථිරයි !*

### අපේ සංගමය සහ මම....
### සාමාජිකත්වය වෙත අවධාරණයෙන්

සංගමය තුළ තම සාමාජිකත්වය රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් සමස්ත සාමාජිකත්වය දැඩි ලෙස වගකීම් සහිත විය යුතු බව අවධාරණය කරන අතර, නිසි කාලසීමාවන් තුළ තම සාමාජික මුදල් ගෙවීම මගින් පමණක් මෙම කාර්ය ඉටුකර ගත හැකි බව සාමාජිකත්වය විසින් පසක් කර ගත යුතුව ඇත. එබැවින් ඔබ සහ ඔබගේ හිතවතුන්ගේ සංගමයේ සාමාජිකත්වය අඛණ්ඩව පවත්වා ගැනීමට පියවර ගැනීම අද දවසේ අත්‍යාවශ්‍ය කරුණ බව අවධාරනය කරන්නෙමු.

*අධ්‍යක්ෂ මඩුල්ල*



# ස්වභාවී 3

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික, හිටපු අධ්‍යාපන මෙන්ම සමාජ සේවා අධ්‍යක්ෂකවරයෙකු වූ ප්‍රවීන චිත්‍ර, මූර්ති හා ඡායාරූප ශිල්පි ප්‍රියන්ත අබේසුන්දර මහතාගේ තෙවන ඒක පුද්ගල සිතුවම් දැක්ම 'ස්වභාවී - 3' නමින් 2018 ජුලි මස 6, 7, 8 හා 9 යන දිනවල කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී පැවති අතර එහිදී සිතුවම් 30 කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රදර්ශනයට එක්කර තිබෙනු දක්නට ලැබුනි.

ප්‍රියන්ත අබේසුන්දරයන්ගේ පෙර පැවති ප්‍රදර්ශනයන් සේම මෙවරද ප්‍රදර්ශිත නිර්මාණ සඳහා විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාර හිමිව තිබීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය.












# අපේ විත්ති


## ග්‍රන්ථකරණයට පිවිසි කැමරා සිත



ප්‍රවීන ඡායාරූප ශිල්පී හා රාජ්‍ය ඡායාරූප කලා උපදේශන සභාවේ වත්මන් සභාපති, අප සංගමයේ ගෞරව සාමාජික බර්ටි ගුණසේකරයන් විසින් රචිත කෘතීන් යුගලක් පසුගිය සැප්තැම්බර් මසදී නිමාවට පත්වූ 2018 කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ දී එළි දැක්වීම සිදුවිය.

දුහුළු බන්ධන නම් වූ නවකථාව රාවය ප්‍රකාශනයක් ලෙසත්, කෙටි කථා 11 කින් සමන්විත ''පවුර'' නම් වු කෙටි කථා සංග්‍රහය Fast Publication ප්‍රකාශනයක් ලෙසත් පාඨක සහෘදයා හට රස විඳීමට අවකාශය හිමිව ඇත.




---

# Crossing Bridges 15 - Medan, Indonesia






පසුගිය අගෝස්තු මාසයේ ඉන්දුනීසියාවේ මෙඩාන් නුවර පවත්වන්නට යෙදුනු Crossing Bridges 15 වාර්ෂික ඡායාරූප ශිල්පි හමුවට ලාංකේය ඡායාරූප ශිල්පීන් සමූහයකට නායකත්වය දෙමින් අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික බන්දු ගුණරත්න මහතා සහභාගි විය. ආසියානු හා අග්නිදිග ආසියානු රටවල් නවයක ඡායාරූප ශිල්පීන් 120 ක කණ්ඩායමක්, සතියක කාලයක් පුරා පැවැත් වුණු රූප චාරිකාවේදී තම තමන්ගේ දැනුම බෙදාගැනීමටත් මිත්‍ර සබඳතා වර්ධනය කර ගැනීමටත් එකිනෙකා හට අවස්ථාව උදා විය.



අපගේ සංගමයේ සාමාජිකයින් කිහිප දෙනෙකුම මෙම වැඩසහනට සහභාගි වූ අතර එහිදී අපගේ ජ්‍යෙෂ්ඨ සාමාජික, හිටපු අධ්‍යක්ෂක - ප්‍රදර්ශන උදේනි අල්විස් මහතා හොඳම මිත්‍රශීලී ශිල්පීන් තිදෙනා තෝරා ගැනීමේදී ඉන් එක් අයෙකු ලෙස තේරී පත්වී සම්මානයට පාත්‍ර විය.

2012 වසරේ පළමුවරට එවකට වසර 08 ක් ගතව තිබූ Crossing Bridges සංවිධානයට එක්වුණු බන්දු ගුණරත්න මහතා දැනට මෙම සංවිධානය වෙනුවෙන් ශ්‍රී ලංකා නායකයා ලෙස ද කටයුතු කරනු ලබයි.

# INPUT 2018

**සමාජ ප්‍රගමනය උදෙසා රූපවාහිනි මාධ්‍ය යොදා ගැනීම අර්ථ පූර්ණ කරනු වස්, ලොව පුරා විහිදුනු රූපවාහිනී නාලිකාවන් නියෝජනය කරන වෘත්තිකයිගෙන් සැදුම් ලත් රාජ්‍ය නොවන සංවිධානයක් වන INPUT (International Public Television) මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන රූපවාහිනී සම්මේලනය INPUT - 2018 මෙවර ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නුවර Brooklyn හිදී අප්‍රේල් 30 සිට මැයි 04 දක්වා පවත්වන ලදී.**

**මෙම සම්මේලනයේදී ප්‍රදර්ශනය කිරීම සඳහා තෝරා ගන්නා ලද රූපවාහිනී වැඩසටහන් අතරට අප සංගමයේ සභාපති කංචන මාරසිංහ මහතා විසින් ජාතික රූපවාහිනිය වෙනුවෙන් නිපදවන ලද "A House is not a home" වැඩසටහන තෝරා ගනු අතර INPUT - 2018 වෙතින් ලද ඇරයුම අනුව කංචන මාරසිංහ මහතා එම සම්මේලනයට සහභාගි විය. එම කෘතිය ද ඇතුළත්ව එහිදී ප්‍රදර්ශනය වූ කෘතීන් MINI INPUT - 2018 ලෙසින් පසුගියදා ජර්මානු සංස්කෘතික මධ්‍යස්ථානය සංවිධානය කරන ශ්‍රී ලාංකික ප්‍රදර්ශනයේදී ලාංකික ප්‍රේක්ෂකයින්ට ද නැරඹීමට අවස්ථාව හිමි විය.**




**Congratulations!**

**Sri Lankan TV director selected for INPUT - 2018**

### මහරගම ප්‍රාදේශීය සාහිත්‍ය තරගාවලියේ
## පද්‍ය රචනා, ගීත රචනා ප්‍රථම ස්ථාන සුනන්ද කෝදාගොඩට

ජාතික සාහිත්‍ය කලා මහෝත්සවයට සමගාමීව සංස්කෘතික දෙපාර්තමේන්තුව හා මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරන ලද ප්‍රාදේශීය සාහිත්‍ය තරගාවලියේ විවෘත පද්‍ය රචනා අංශයේ සහ විවෘත ගීත රචනා අංශයේ ප්‍රථම ස්ථානයන් දෙකම දිනා ගැනීමට සුනන්ද කෝදාගොඩ සමත් විය.

''නිවුණ, හැදුණු, පිරුණු, සොඳුරු මිනිසුන් පිරි පින්බර දේශයක් උදෙසා සාහිත්‍ය හා කලාව'' යන තේමාව යටතේ මෙවර සාහිත්‍ය කලා මහෝත්සවය උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.





ඡායාරූපවලින් දැක්වෙන්නේ සුනන්ද කෝදාගොඩ මහරගම ප්‍රාදේශීය සාහිත්‍ය කලා මහෝත්ස්වයේදී ප්‍රවීණ සිනමා හා රූපවාහිනී රංගන ශිල්පී බුද්ධි වික්‍රම මහතා අතින් ගීත රචනා ප්‍රථම ස්ථානයටත්, ප්‍රවීණ චිත්‍ර, මූර්ති, කැටයම් ශිල්පී අනුර දහනායක, මහරගම සංස්කෘතික බලමණ්ඩලයේ ලේකම් සුගත් දෙව් පතිනායක, යන මහතුන් වෙතින් විවෘත පද්‍ය රචනා අංශයේ ප්‍රථම ස්ථානයටත් හිමි තිළිණ හා සහතිකපත් ලබාගත් අවස්ථාවයි.







## වාර්ෂික චාරිකාව

මේ සඳහා සියලු කටයුතු ලහි ලහියේ සිදුවන බැවින්
ඔබේ සහභාගිත්වය සමාජ සේවා අධ්‍යක්ෂකතුමන් වෙත දන්වා
සුන්දර අත්දැකීමක හිමිකාරිත්වය ලබා ගන්න.

**වැඩිදුර විස්තර 0777 305 836**

## 56 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමය විසින් පවත්වනු ලබන 56 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය සඳහා අයදුම්පත් භාර ගැනීම මේ දිනවල සිදුවන අතර, එය 2018 නොවැම්බර් 30 වන දිනෙන් අවසන් වීමට නියමිතය.

මේ සඳහා අයදුම් කරනු ලබන සාමාජික සාමාජිකාවන් තම සාමාජික මුදල් නිසි පරිදි ගෙවීම මගින් කාර්යයන් නිසි ලෙස නිම කිරීමට පහසුවක් වන බව අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කර සිටී.

## අලව්ව රාහුල ජාතික පාසලට ඡායාරූප සංගමයක්....

අලව්ව රාහුල ජාතික පාසලේ විදුහල්පතිවරයාගේ ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය විසින් එම පාසල සඳහා ඡායාරූප සංගමයක්, අධ්‍යක්ෂ - සංවර්ධන හා ප්‍රවර්ධන තුෂාර ධම්මික සමරකෝන් හා අධ්‍යක්ෂ ලේඛකාධිකාරි සාලිය ලියනගේ යන මහත්වරුන්ගේ මගපෙන්වීම යටතේ පසුගියදා පිහිටවනු ලැබීය. ඉදිරියේදී එම පාසල් සිසුන් සඳහා විෂයානුබද්ධ ප්‍රායෝගික වැඩ මුළු සංවිධානය කිරීමට ද නියමිතව ඇත.

## ප්‍රකාශන පුවත්

### ඔබේ තොරතුරුත් පිළිසඳරට ලියන්න

ඔබේ ඡායාරූප දිවියේ ජයග්‍රහණ, වැදගත් කඩඉම්, සංගමයේ සාමාජිකයින් සමග බෙදාගන්නට, ඔබේ තොරතුරුත් පිළිසඳරට යොමුකරන්න.

**ගරු, ප්‍රකාශන අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,**
**නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.**
Email : npassrilanka@gmail.com
pnw5005@gmail.com

**සියළු තොරතුරු සඳහා**
NPAS
FOLLOW US ON facebook
**වෙත යොමුවන්න.**

## සංගමයේ කෙටි පණිවුඩ ඔබට එනවද?

SMS

සංගමයේ නිල නිවේදන සහෘද සාමාජික භවතුන් හට
ලබාදීම අරමුණුකොට පවත්වාගෙන යන කෙටි පණිවුඩ සේවාව
(sms alert) සමඟ ඔබ සක්‍රීය වී නොමැති නම් නොපමාව ප්‍රකාශන අධ්‍යක්ෂ
ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ (072 3230329) අමතා ඒ බව දැනුම් දෙන්න.
එමගින් සංගමයේ නිල කටයුතු පිළිබඳව
ඔබට ඉක්මනින් දැනුවත් වීමේ අවස්ථාව උදාවනු ඇත.

**සංගමයේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම මෙම දිනවල සිදුවන අතර ඉදිරියේදී ඔබ හට සංගමය පිළිබඳ සවිස්තර තතු විත්ති පහසුවෙන් උකහා ගැනීමට එමගින් අවස්ථාව හිමිවනු ඇත.**

## අපගේ ශෝකය

- ❖ අප සංගමයේ යාවජීව සාමාජික නුවන් ගල්පාය මහත්මාගේ දයාබර පියාණන් වු දයාරත්න ගල්පාය මහතාගේ අභාවය,
- ❖ අප සංගමයේ යාවජීව සාමාජික ධම්මික විජේසිංහ මහත්මාගේ දයාබර පියාණන් වූ ඩී. විජේසිංහ මහත්මාගේ අභාවය,
- ❖ ඡායාරූපකරණයේ ප්‍රවීණයකු වූ ඉන්ද්‍රනාථ තේනුවර මහත්මාගේ දයාබර පියාණන් වු තේනුවර ගුණතිලක මහත්මාගේ අභාවය,
- ❖ කුරුණෑගල ඡායාරූප සංගමයේ සභාපති ධූරය දැරූ ආතර් වීරසිංහ මහත්මාගේ අභාවය,
- ❖ අප සංගමයේ සාමාජික කුමාර සේනානායක මහත්මාගේ දයාබර මෑණියන් වූ හේවාවර්ධනගේ ඩිංගිහාමි මහත්මියගේ අභාවය, යන අභාවයන් පිළිබඳව



**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සමස්ථ සාමාජිකත්වයේ ශෝකය පුද කරන්නෙමු !**

## ජයග්‍රහණ

### විහාර මහා දේවි උද්‍යාන ඡායාරූප තරගය (2018 ජූලි)

❖ **ඒක වර්ණ**

1. සමීර කොතලාවල
2. ගගන් කරුණාචන්ද්‍ර
3. ගගන් කරුණාචන්ද්‍ර
4. සමීර කොතලාවල
5. ගිම්හාන් ජයසිංහ

❖ **වර්ණ**

1. නවීන් දම්සර පෙරේරා
2. නවීන් දම්සර පෙරේරා
3. නවීන් දම්සර පෙරේරා
4. නවීන් දම්සර පෙරේරා
5. ගගන් කරුනාචන්ද්‍ර

❖ **තරඟ විනිශ්චය**

ප්‍රියන්ත අමරසිංහ මයා
ප්‍රියන්ත අබේසුන්දර මයා
අතුල රණරාජා මයා

**විහාර මහා දේවි උද්‍යාන ඡායාරූප තරගය සඳහා වූ බී.පී. වීරවර්ධන ශූරතා පලිහ - සමීර කොතලාවල**

### කැළණි විහාර ඡායාරූප තරගය (අගෝ. 2018)

❖ **ඒක වර්ණ**

1. ගගන් කරුණාචන්ද්‍ර
2. මධූෂා සෙනෙවිරත්න
3. සමීර කොතලාවල
4. ගගන් කරුණාචන්ද්‍ර
5. ගගන් කරුණාචන්ද්‍ර

❖ **වර්ණ**

1. මොහාන් ගුරුසිංහ
2. ගිම්හාන් ජයසිංහ
3. මොහාන් ගුරුසිංහ
4. නවීන් දම්සර පෙරේරා
5. ගගන් කරුණාචන්ද්‍ර

❖ **තරඟ විනිශ්චය**

බර්ට් ගුණසේකර මයා
යමුනා රශ්මිකා මහත්මිය
අමන්දා සමානි මෙනවිය

**කැළණි විහාර ඡායාරූප තරගය සඳහා වූ එල්.බී.එස්.එස් බාලසූරිය ශූරතාව ගගන් කරුණාචන්ද්‍ර**

### දෙහිවල සත්ව උද්‍යාන ඡායාරූප තරගය (සැප්. 2018)

❖ **ඒක වර්ණ**

1. නවීන් දම්සර පෙරේරා
2 ගගන් කරුණාචන්ද්‍ර
3. අමල් මාධව
4. මොහාන් ගුරුසිංහ
5. චාමර රණතුංග

❖ **වර්ණ**

1. කේ.ඒ.ඩී.ටී.පී. කරුණානායක
2. ධනන්ජය චතුරංග
3. මොහාන් ගුරුසිංහ
4. සමීර කොතලාවල
5. චාමර රණතුංග

❖ **තරඟ විනිශ්චය**

1. ශාන්ත ගුණරත්න මයා
2. ප්‍රියන්ත අමරසිංහ මයා
3. ඉදුනිල් මුණසිංහ මයා

**සත්ව උද්‍යාන ඡායාරූප තරගය සඳහා වූ විල්සන් හැගොඩ ශූරතාව නවීන් දම්සර පෙරේරා**

### මාසික ඡායාරූප තරගය ඔක්තොම්බර් 2018

❖ **ඒක වර්ණ**

1. මොහාන් ගුරුසිංහ
2. ඊශානි නාරාහේන්පිට
3. ඊශානි නාරාහේන්පිට
4. ගගන් කරුණාචන්ද්‍ර
5. චාමර රණතුංග

❖ **වර්ණ**

1. ගගන් කරුණාචන්ද්‍ර
2. මොහාන් ගුරුසිංහ
3. මොහාන් ගුරුසිංහ
4. ධනංජය චතුරංග
5. චාමර රණතුංග

❖ **තරඟ විනිශ්චය**

1. ඩී.කේ. ලැන්ට් මහතා
2. කංචන මාරසිංහ මයා
3. විරාජ් ලියනාරච්චි මයා

**මාසික තරඟ සංවිධායක මෙහෙවර**
**මධුරංග අබේවර්ධන (077 3549449)**


## පිළිසඳර

**සටහන හා සැකැස්ම**
ප්‍රදීප් එන්. වෙදමේස්ත්‍රිගේ

**රූ රටා සහ ග්‍රැෆික් නිර්මාණ**
සුමිත් කුමාර

මුද්‍රණය - තේජානී ප්‍රින්ටර්ස් කළුතර

**විශේෂ ස්තූතිය**

❖ අධ්‍යක්ෂ මඩුල්ල

❖ මනුජිත් කටුගම්පොල, මධුරංග අබේවර්ධන, උවිදුලොකු ලියන, තිලානි ශානිකා, චමින්ද වීරසිංහ

QD/81/NEWS/2018

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ